# **පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2012**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### **1.1** <u>මතය ව්‍යාචනය</u>

මෙම වාර්තාවේ 1.2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### **1.2** <u>**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**</u>

### **1.2.1** <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

සමාලෝචිත වර්ෂයේ අරමුදලේ සමස්ථ විශ්‍රාම වැටුප් වියදම ගණනය කර ආදායම් වියදම් ගිණුමට ගලපා නොතිබුණි.

### 1.2.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ විශ්‍රාම වැටුප් වියදම රු.3,196,199 ක් වුවද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිගණක දත්ත පද්ධතියේ වියදම් වර්ගීකරණයට අනුව සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් වියදම රු.54,139,919 ක් වූයෙන් රු.50,943,720 ක විෂමතාවක් අනාවරණය විය. එම වෙනස පැහැදිලි කිරීමට අවශ්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කළමනාකරණය අපොහොසත් විය.

(ආ) වාර්ෂිකව අරමුදලට ලැබුණු දායක මුදල් සමුච්චිත අරමුදලට ගිණුම් ගත කර තිබූ අතර, ලැබී ඇති දායක මුදල් ශේෂය හඳුනා ගැනීමට හැකි පරිදි වෙනම ලෙජර් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

### 1.2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමතකර නොතිබුණි. |
| (ආ) 1986 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ නියෝග මාලාවේ 8 වන වගන්තිය | දායිකාවක විසින් හා පළාත් පාලන ආයතන විසින් අරමුදලට ගෙවූ සියලු දායක මුදල් පිළිබඳ ලේඛන පවත්වා ගැනීම සිදුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.31,176,110 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.37,137,830 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,961,720 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොළී අනුපාත අඩුවීම මත පොළී ආදායම රු.963,554 කින් අඩුවීමත්, රු.5,397,553 ක ආයෝජන කල් පිරීමේ ප්‍රාග්ධන අලාභ ඇති වීමත් මූල්‍ය ප්‍රතිඵලය පිරිහීමට ප්‍රධාන වශයෙන් ඉවහල් වී තිබුණි.

## 3. පද්ධති සහ පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) වියදම් වාර්තා

(ඇ) ආයෝජන